// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1892/37 - 2014 දෙසැම්බර් මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2014.12.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී 7/2001.

### 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත

1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වැනි වගන්තිය යටතේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහාචාර්ය ජී. එල්. පීරිස්,<br>
විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2014 දෙසැම්බර් මස 09 වැනි දින,<br>
කොළඹ දී ය.

නියෝග

2012 මැයි මස 15 වන දින අංක 1758/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) 4 වන නියෝගයේ (7) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(7) ලැයිස්තුවට යම් නමක් හෝ නම් ඇතුළත් කිරීමට හෝ ලැයිස්තුවෙන් යම් නමක් හෝ නම් ඉවත් කිරීමට අවශ්‍ය වන අවස්ථාවක දී හෝ ලැයිස්තුවේ යම් තොරතුරක් සංශෝධනය කිරීමට හෝ යාවත්කාලීන කිරීමට අවශ්‍ය වන අවස්ථාවකදී, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ ඇති ලැයිස්තුව සංශෝධනය කිරීම මඟින් කරනු ලැබිය යුතු ය. ඒ සෑම සංශෝධනයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය." ;

(2) 4 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝග ඇතුළත් කිරීමෙන් :-

"4අ. (1) ස්වභාවික හෝ නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් නම් කිරීම සඳහා යම් විදේශ රාජ්‍යයක් විසින් කරනු ලබන සෑම ඉල්ලීමක්ම අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා වෙත ඉල්ලීමක් කරනු ලැබීමෙන් පසුව අමාත්‍යවරයා විසින් එම ඉල්ලීම වහාම නිසි බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

1A - G 20742 — 10 (2014/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(3) (අ) අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ලැබීමෙන් පසුව, නිසිබලධරයා විසින් වහාම ශ්‍රී ලංකාවේ යම් අදාළ අධිකාරියකින් උපදෙස් ලබා ගෙන විදේශ රාජ්‍යය විසින් සපයන ලද තොරතුරු ඇගයීමට ලක් කරනු ලැබිය යුතු ය.

(ආ) විදේශ රාජ්‍යයක් විසින් සපයා ඇති තොරතුරු ප්‍රමාණවත් නොවන බවට නිසිබලධරයාගේ අදහස වන අවස්ථාවක දී, නිසිබලධරයා විසින් ඒ රාජ්‍යයෙන් වැඩිදුර තොරතුරු ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(4) විදේශ රාජ්‍යය විසින් නම් කිරීම අපේක්ෂා කරනු ලබන ස්වභාවික හෝ නෛතික තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය නම් කිරීම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බවට නිසිබලධරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, නිසිබලධරයා විසින් ඒ ස්වභාවික හෝ නෛතික තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය නම් කිරීම සඳහා අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය යුතු ය.

(5) විදේශ රාජ්‍යය විසින් නම් කිරීම අපේක්ෂා කරනු ලබන ස්වභාවික හෝ නෛතික තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය නම් කිරීම සඳහා ප්‍රමාණවත් හේතු නොමැති බවට නිසිබලධරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, නිසිබලධරයා විසින් ඒ කරුණු වහාම අමාත්‍යවරයා වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(6) විදේශ රාජ්‍යය විසින් කරන ලද ඉල්ලීමේ ප්‍රතිඵලය අමාත්‍යවරයා විසින් වහාම අදාළ විදේශ රාජ්‍ය වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

4ආ. (1) මේ නියෝග යටතේ අමාත්‍යවරයා විසින් නම් කරන ලද යම් ස්වභාවික හෝ නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් නම් කරන ලෙස, නිසිබලධරයාගේ නිර්දේශය මත, අමාත්‍යවරයා විසින් යම් විදේශ රාජ්‍යයකින් ඉල්ලා සිටිනු ලැබිය යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ කරනු ලබන යම් ඉල්ලීමක් සමඟ -

(අ) ඒ ස්වභාවික හෝ නෛතික තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය ඵලදායීව හා නිවැරදි ලෙස හඳුනා ගැනීමට හැකිවන තොරතුරු ;

(ආ) ශ්‍රී ලංකාව තුළ, ඒ ස්වභාවික හෝ නෛතික තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය නම් කිරීම සඳහා උපකාරී වූ විස්තර ; සහ

(ඇ) ඒ විදේශ රාජ්‍යය තුළ, ඒ ස්වභාවික හෝ නෛතික තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය නම් කිරීම සාධාරණීකරණය කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු,

ඉදිරිපත් කරනු ලැබිය යුතුය.".

(3) 5 වන නියෝගයේ -

(අ) (1) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(1) 4 වැනි නියෝගය ප්‍රකාර නම් කිරීමෙන් පසුව, නම් කරන ලද යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් සතු හෝ නම් කරන ලද යම් ස්වභාවික හෝ නෛතික තැනැත්තකුට, කණ්ඩායමකට හෝ අස්ථිත්වයකට සම්පූර්ණයෙන්ම නැතහොත් හවුලේ අයිතිව තිබෙන හෝ නම් කරන ලද යම් ස්වභාවික හෝ නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් විසින් සම්පූර්ණයෙන්ම නැතහොත් හවුලේ දරනු ලබන හෝ පාලනය කරනු ලබන හෝ ඒ නම් කල තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය සඳහා සහ වෙනුවෙන් හෝ ඒ නම් කළ තැනැත්තාගේ, කණ්ඩායමේ හෝ අස්ථිත්වයේ විධානය මත වෙනත් යම් තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් විසින් සම්පූර්ණයෙන්ම නැතහොත් හවුලේ අයිතිය දරන, සතුව තිබෙන, දරනු ලබන හෝ පාලනය කරනු ලබන සියලු අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් නිසි බලධරයා විසින් තත්කාර්ය සඳහා කරනු ලබන නියමයක් මගින් වහාම ක්‍රියා විරහිත කරනු ලැබිය යුතු ය. ඒ තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය නම් කරනු ලැබ ඇති තාක් කල් ඒ අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ අර්ථික සම්පත් ක්‍රියාවිරහිතව පැවතිය යුතු ය. ;

(ආ) (2) වන ඡේදයේ (අ) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

" (අ) කිසිම තැනැත්තකු විසින්, මේ නියෝගවල 4 වැනි නියෝගය ප්‍රකාර නම් කරනු ලැබ ඇති යම් ස්වභාවික හෝ නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් වෙත හෝ, යම් ස්වභාවික හෝ නෛතික තැනැත්තකුගේ හෝ කණ්ඩායමක හෝ අස්ථිත්වයක ප්‍රතිලාභය සඳහා හෝ ඒ නම් කළ තැනැත්තා කණ්ඩායම හෝ අස්ථිත්වය සඳහා සහ වෙනුවෙන් හෝ ඒ නම් කළ තැනැත්තාගේ කණ්ඩායමේ හෝ අස්ථිත්වයේ විධානය පරිදි වෙනත් යම් තැනැත්තෙකු කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් වෙත හෝ ප්‍රතිලාභය සඳහා සෘජුව හෝ වක්‍රව යම් අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් සහ මූල්‍ය හෝ වෙනත් ආශ්‍රිත සේවා ලබා දීම නොකළ යුතු ය." ;

(4) 8 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝග ඇතුළත් කිරීමෙන් :-

"8අ. (1) තමා, නම් කළ තැනැත්තකු නොවන බවට කියා සිටිනු ලබන තැනැත්තකු විසින්, තමා ලැයිස්තුවේ නම සඳහන් තැනැත්තකු නොවන බවට සඳහන් කරමින් සහතිකයක් නිකුත් කරන ලෙස ඉල්ලමින් නිසිබලධරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඒ සම්බන්ධයෙන් උචිත පරිදි විමසීම් කිරීමෙන් පසුව සහ ඒ ඉල්ලුම්කරු නම් කළ තැනැත්තකු නොවන බවට තහවුරු කර ගැනීමෙන් පසුව, නිසිබලධරයා විසින් ඒ බවට ඒ ඉල්ලුම්කරු වෙත සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ සහතිකයක් නිකුත් කිරීම නිසිබලධරයා විසින් ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරනු ලබන අවස්ථාවක දී, ඒ සඳහා වන හේතු ද සමග ස්වකීය තීරණය නිසිබලධරයා විසින් යුක්ති සහගත කාලසීමාවක් තුළ ඉල්ලුම්කරු වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

8ආ. මේ නියෝගවල 8අ වන නියෝගය යටතේ වූ නිසිබලධරයාගේ තීරණය මගින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ තීරණය සමාලෝචනය කිරීම සඳහා, ඒ තීරණය තමා වෙත දැනුම් දෙනු ලැබූ දින සිට දින තිහක කාලයක් ඇතුළත, මහාධිකරණය වෙත ඒ තීරණයට එරෙහිව ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය." ;

(5) 9 වන නියෝගයේ (1) වන ඡේදයේ (ආ) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(ආ) පහත සඳහන් කරුණු පිළිබඳව, එනම් -

(i) අරමුදල්වල තත්ත්වය, ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ග සහ අරමුදල් සම්බන්ධයෙන් ගන්නා ලද වෙනත් යම් ක්‍රියාමාර්ග පිළිබඳව ;

(ii) නම් කළ තැනැත්තා වෙනුවෙන් අදාළ ආයතනය විසින් දරනු ලබන යම් අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත්වල ස්වභාවය සහ ගණන හෝ ප්‍රමාණය හෝ නම් කළ තැනැත්තා වෙනුවෙන් යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කරන ලද හෝ දරන ලද ගනුදෙනු පිළිබඳව ;

(iii) නම් කළ තැනැත්තකු විසින් හෝ වෙනුවෙන් කරන ලද යම් ගනුදෙනුවක් හෝ ගනුදෙනු කිරීමට තැත්කිරීමක් පිළිබඳව ;

(iv) ක්‍රියා විරහිත කරන ලද අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් සම්බන්ධයෙන් වන යම් ගනුදෙනුවක් හෝ ගනුදෙනු කිරීමට තැතැත්කිරීමක් පිළිබඳව ; සහ

(v) මේ නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීම පහසු කරවනු ලබන වෙනත් යම් තොරතුරක් පිළිබඳව,

අවස්ථාවෝචිත පරිදි නිසි බලධරයා වෙත හෝ මූල්‍ය බුද්ධි ඒකකය වෙත තොරතුරු සැපයිය යුතු ය."

(6) 12 වන නියෝගයේ (3) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-

"(4) මේ නියෝගවල විධිවිධාන බලාත්මක කිරීමේ දී නිසිබලධරයා විසින් යම් තැනැත්තකුගෙන් හෝ රාජ්‍ය ආයතනයකින් උපදෙස් ලබා ගැනීම සහ තොරතුරු ඉල්ලා සිටීම කරනු ලැබිය හැකි ය.".

12 - 913/1

එල්.ඩී.බී 7/2001.

**1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත**

1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වැනි වගන්තිය යටතේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහාචාර්ය ජී. එල්. පීරිස්,
විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2014 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2012 මැයි මස 31 වන දින අංක 1760/40 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2012 අංක 2 දරන එක්සත් ජාතීන්ගේ නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) 15 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :-

"15අ. (1) අමාත්‍යවරයා විසින්, කලින් කළ, ආරක්ෂක විෂය පවරා ඇති අමාත්‍යවරයා විමසා සහ නිසි බලධරයාගේ නිර්දේශ මත -

(අ) අල්කයිඩා සංවිධානය හෝ තලිබාන් සංවිධානය සමග සහයෝගීව ක්‍රියාකරන බවට විශ්වාස කිරීමට නිසි බලධරයාට සාධාරණ හේතු ඇත්තා වූ යම් ස්වාභාවික තැනැත්තකු ;

(ආ) අල්කයිඩා සංවිධානය හෝ තලිබාන් සංවිධානය සමග සහයෝගීව ක්‍රියාකරන බවට විශ්වාස කිරීමට නිසි බලධරයාට සාධාරණ හේතු ඇත්තා වූ යම් නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් ;

(ඇ) ඉහත (අ) හෝ (ආ) අනුඡේදවල සඳහන් ස්වභාවික හෝ නෛතික තැනැත්තන්, කණ්ඩායම් හෝ අස්ථිත්ව එකක් හෝ වැඩි ගණනක් විසින් ඍජුව හෝ වක්‍රව අයිතිය දරනු ලබන හෝ පාලනය කරනු ලබන යම් නෛතික තැනැත්තකු, කණ්ඩායමක හෝ අස්ථිත්වයක් ;

(ඈ) ඉහත (අ) හෝ (ආ) අනුඡේදවල සඳහන් ස්වභාවික හෝ නෛතික තැනැත්තන්, කණ්ඩායම් හෝ අස්ථිත්ව එකක් හෝ වැඩි ගණනක් වෙනුවෙන් හෝ ඒවායේ විධාන මත ක්‍රියා කරන යම් ස්වභාවික හෝ නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක්,

නම් කිරීම පිළිබඳව සම්බාධක පැනවීමේ කමිටුව වෙත යෝජනා කරනු ලැබිය හැකි ය.

(2) (1) වන ඡේදය යටතේ නම් කිරීම සඳහා වන යම් යෝජනාවක්, එම අදාළ තැනැත්තන්ට, කණ්ඩායම්වලට සහ අස්ථිත්ව වලට එරෙහිව අපරාධ විමර්ශණයක් පැවතීම හෝ නීති කෘත්‍ය විභාගවෙමින් පැවතීම හෝ නොසළකා එම අදාළ තැනැත්තන්, කණ්ඩායම් සහ අස්ථිත්ව සම්බන්ධයෙන් වූ යම් අදාළ ප්‍රභවයකින් ලබාගත් ඉතා නිවැරදි තොරතුරු හෝ දේ මත පදනම් විය යුතු ය.

(3) (1) වන ඡේදය යටතේ නම් කරනු ලැබීමට යෝජිත ස්වභාවික හෝ නෛතික තැනැත්තන්, කණ්ඩායම් හෝ අස්ථිත්ව ඵලදායීව සහ නිවැරදි ලෙස හඳුනාගැනීමට හැකිවනු පිණිස ඒ ස්වභාවික හෝ නෛතික තැනැත්තන්ගේ, කණ්ඩායම්වල හෝ අස්ථිත්වවල නම් සමග ප්‍රමාණවත් විස්තර ඇතුළත් කර ඇති බවට තහවුරු කිරීම සඳහා නිසි බලධරයා විසින් සියලු සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් කරන ලද යම් යෝජනාවක ප්‍රතිඵලයක් ලෙස, සම්බාධක පැනවීමේ කමිටුව විසින් නම් කරනු ලදුව ඒකාබද්ධ ලැයිස්තුවේ පළකරන ලද නම්, ඒකාබද්ධ ලැයිස්තුවේ රඳවා තබා ගැනීම සඳහා හෝ ඉන් ඉවත් කිරීම සඳහා හේතු ඇති බව සහතික කරගනු පිණිස හෝ ඒ නම් හා සම්බන්ධ තොරතුරු යාවත්කාලීන කිරීම පිණිස නිසි බලධරයා විසින් ඒකාකාර කාලපරාස අනුව සහ අවම වශයෙන් සෑම වසරකට එක් වරක්වත් ඒ නම් සමාලෝචනය කිරීම සඳහා කටයුතු සැලැස්විය යුතු ය.

(5) (4) වන ඡේදය යටතේ නම් සමාලෝචනය කිරීමෙන් පසුව යම් නමක් තවදුරටත් ඒකාබද්ධ ලැයිස්තුවේ රඳවා තබාගැනීම අවශ්‍ය නොවන බවට අනාවරණය වන අවස්ථාවක දී, ඒ නම ඒකාබද්ධ ලැයිස්තුවෙන් ඉවත් කරන ලෙස අමාත්‍යවරයා විසින් සම්බාධක පැනවීමේ කමිටුව වෙත යෝජනා කරනු ලැබිය යුතු ය.

(6) ඒකාබද්ධ ලැයිස්තුවේ ඇතුළත් කර ඇති යම් නම් කරන ලද තැනැත්තකුට අදාළ යම් තොරතුරක් යාවත්කාලීන කිරීමට අවශ්‍යවන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් ඒ තොරතුරු සම්බාධක පැනවීමේ කමිටුව වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(7) අමාත්‍යවරයා විසින් -

(අ) යම් නමක් නම් කරනු ලැබීම සඳහා (1) වන ඡේදය යටතේ යෝජනා කරන අවස්ථාවක දී ;

(ආ) යම් නමක් ඒකාබද්ධ ලැයිස්තුවෙන් ඉවත් කිරීම සඳහා (5) වන ඡේදය යටතේ යෝජනා කරන අවස්ථාවක දී ;

(ඇ) යම් තොරතුරක් යාවත්කාලීන කිරීම සඳහා, යම් තොරතුරක් (6) වන ඡේදය යටතේ සන්නිවේදනය කරනු ලබන අවස්ථාවක දී,

තත්කාර්ය සඳහා සම්බාධක පැනවීමේ කමිටුව විසින් පිළිගනු ලැබ ඇති කාර්ය පටිපාටිය සහ සම්මත ආකෘති අමාත්‍යවරයා විසින් අනුගමනය කරනු ලැබිය යුතු ය.

(8) නම් කිරීම සඳහා වූ යෝජනාවක් ඉදිරිපත් කිරීමට පෙරාතුව කවර හෝ අවස්ථාවක, යම් තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් යෝජනා කිරීම සඳහා කටයුතු කරමින් පවතින බවට හෝ යෝජනා කිරීම සඳහා සලකා බලමින් පවතින බවට ඒ තැනැත්තාට, කණ්ඩායමට හෝ අස්ථිත්වයට කිසිම තැනැත්තකු විසින් දැන්වීමක් නොකළ යුතු ය.".

(2) 12 වන නියෝගයේ (1) වන ඡේදයේ (ආ) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(ආ) පහත සඳහන් කරුණු සම්බන්ධයෙන්, එනම් :-

(i) අරමුදල්වල තත්ත්වය, 5 වන නියෝගය සහ 6 වන නියෝගය යටතේ වූ ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ග සහ අරමුදල් සම්බන්ධයෙන් ගන්නා ලද වෙනත් යම් ක්‍රියාමාර්ග පිළිබඳව ;

(ii) නම් කළ තැනැත්තා වෙනුවෙන් අදාළ ආයතනය විසින් දරනු ලබන යම් අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත්වල ස්වභාවය සහ ගණන හෝ ප්‍රමාණය හෝ නම් කළ තැනැත්තා වෙනුවෙන් යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කරන ලද හෝ දරන ලද ගනුදෙනු පිළිබඳව ;

(iii) නම් කළ තැනැත්තකු විසින් හෝ වෙනුවෙන් කරන ලද යම් ගනුදෙනුවක් හෝ ගනුදෙනු කිරීමට තැත්කිරීමක් පිළිබඳව ;

(iv) ක්‍රියා විරහිත කරන ලද අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් සම්බන්ධයෙන් වන යම් ගනුදෙනුවක් හෝ ගනුදෙනු කිරීමට තැතැත්කිරීමක් පිළිබඳව ; සහ

(v) මේ නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීම පහසු කරවනු ලබන වෙනත් යම් තොරතුරක් පිළිබඳව,

අවස්ථාවෝචිත පරිදි නිසි බලධරයා වෙත හෝ මූල්‍ය බුද්ධි ඒකකය වෙත තොරතුරු සැපයිය යුතු ය.";

(3) 16 වන නියෝගයේ (3) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-

"(4) මේ නියෝගවල විධිවිධාන බලාත්මක කිරීමේදී නිසි බලධරයා විසින් යම් තැනැත්තකුගෙන් හෝ රාජ්‍ය ආයතනයකින් උපදෙස් ලබාගැනීම සහ තොරතුරු ඉල්ලා සිටීම කරනු ලැබිය හැකි ය.".

12 - 913/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.